# කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

දුරකථන : 011 2686686
ෆැක්ස් : 011 2691443
විද්‍යුත් තැපැල : metnmc@gmail.com
වෙබ් අඩවිය : www.meteo.gov.lk


නිවේදන අංකය : **01**

WW/O/18/06/19/01

වර්ණය : ඇම්බර්

## තද සුළං සහ රළු මුහුදු ප්‍රදේශ පිළිබඳව අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2018 ජූනි මස 21 වන දින ප.ව. 03.00 වන තෙක් වලංගු වන පරිදි
2018 ජූනි මස 19 වන දින ප.ව. 03.00 ට නිකුත් කරන ලදී.

### දිවයිනේ උතුරු සහ මන්නාරම් බොක්ක මුහුදු ප්‍රදේශ සඳහා

**සැලකිලිමත් වන්න!**

අද දින (ජූනිමස 19) සිට දිවයිනේ උතුරු සහ මන්නාරම් බොක්ක මුහුදු ප්‍රදේශවල විටින් විට හමන තද සුළං (පැ.කි.මී. 60-70 පමණ) ඇති විය හැක.

පුත්තලම සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 60 -70 දක්වා වැඩි විය හැකි අතර පුත්තලම සිට මන්නාරම දක්වා වන මුහුදු ප්‍රදේශ රළු හෝ ඉතා රළු විය හැක.

හම්බන්තොට සිට පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 60 දක්වා වැඩි විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ රළු විය හැක.

සෙසු මුහුදු ප්‍රදේශවල ද සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 50 දක්වා වැඩි විය හැකි අතර, එවිට එම මුහුදු ප්‍රදේශ තරමක් රළු විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.




Recived
3.00 p.m
19/06/2018